## උද්භිද උද්‍යාන භාර අරමුදල-2012

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට උද්භිද උද්‍යාන භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1. 2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගොඩනැගිලි ක්ෂය සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රයේ දක්වා තිබුණු රු.20,702,460 ක ගොඩනැගිලි වටිනාකම තුළ 2010 වර්ෂයේදී රු.438,391 ක් වැය කර මිලදී ගන්නා ලද උපකරණවල වටිනාකම ඇතුළත් කර තිබුණු බැවින් ගොඩනැගිලිවල වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද, උපකරණවල වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) 2009 සිට 2012 දක්වා කාල පරිච්ඡේදය තුළ සිදුකරන ලද ඉදිකිරීම් කර්මාන්ත 05 කට අදාල රු.642,307 ක රැඳවුම් මුදල් ගිණුම් ගත කර නොතිබුණු අතර එම රැඳවුම් මුදල් සමාලෝචිත වර්ෂය තුල ගෙවීමේදී වර්ෂයේ වියදමක් ලෙසට ආදායම් හා වියදම් ගිණුමේ දැක්වීම නිසා සමාලෝචිත වර්ෂයේ වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**1.2.3 නිරවුල් නොකළ ගිණුම් ශේෂ**

2002 වර්ෂයේ රු.1,364,586 ක් වැයකර පේරාදෙණිය උද්භිද උද්‍යානය සඳහා තනන ලද විදුලිමය පිවිසුම් ගේට්ටුව නිසි පරිදි ක්‍රියාත්මක නොවීම හේතුවෙන් 2010 වර්ෂයේදී ගලවා ඉවත්කර තිබුණු අතර, ඒ වෙනුවෙන් වූ රු.330,792 ක රැඳවුම් මුදල් නිරවුල් නොකර වසර 9 කට අධික කාලයක් ශේෂපත්‍රයේ උපචිත වියදම් ලෙස දක්වා තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.66,186,911 ක අතිරික්තයක් වූ අතර, එයට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.74,466,125 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.8,279,214 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ප්‍රවේශ පත්‍ර අලෙවි ආදායම සහ කාරක ලාභවල එකතුව රු.82,366,613 සිට රු.89,186,425 දක්වා රු.6,819,812 කින් හෙවත් සියයට 8.28 කින් වැඩි වී තිබුණද, වර්ෂයේ මුළු පුනරාවර්තන වියදම රු.7,900,488 සිට රු.22,999,513 දක්වා රු. 15,099,025 කින් හෙවත් සියයට 191.12 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵල පිරිහීමට බලපා තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

**කාර්ය සාධනය**

(අ) මල් වගා උපදෙස් පොත් සහ පැල විකුණුම් ආදායම් වාර්ෂිකව අඩු වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ආදායම | | |
|---|---|---|---|
| | 2012 | 2011 | 2010 |
| | රු. | රු. | රු. |
| මල් වගා උපදෙස් පොත් අලෙවිය | 77,000 | 102,110 | 141,425 |
| පැල විකුණුම් | 725 | 379,052 | 854,215 |

(ආ) අරමුදලේ ආදායම් වර්ධනය කර ගැනීම සඳහා අරමුදල පිහිටුවීමට අදාල ගිවිසුමේ විශේෂිත ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට ඉඩකඩ සලසා තිබුණද එසේ ආදායම් උපයා ගැනීමට විශේෂිත ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි.

(ඇ) උද්භිද උද්‍යාන භාර අරමුදල පිහිටුවීමේ ගිවිසුම අනුව, උද්භිද උද්‍යාන නරඹන්නන්ගේ පහසුව සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමට ඉඩකඩ සලසා තිබුණි. නමුත් පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ ජල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ජල ටැංකි 2 ක් ඉදිකිරීමට 2008 වර්ෂයේදී රු.1,000,000 ක් මධ්‍යම පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ගෙවා තිබුණද, 2013 අප්‍රේල් 04 දින වන විටද අදාල කාර්යය ඉටුකර නොතිබුණි.

(ඇ) හක්ගල උද්භිද උද්‍යානයේ අභ්‍යන්තර අතුරු මාර්ග වැඩිදියුණු කිරීම සඳහා 2012 ඔක්තෝබර් මාසයේ දී රු.405,500 ක් වැය කර කොන්ක්‍රීට් ගල් 10,000 ක් ඇතුලු විවිධ ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදීගෙන උද්‍යානය තුළ රැස්කර තිබුණද, 2013 මාර්තු මස වන විටද අදාල කාර්ය ආරම්භ කර නොතිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 ගිණුම් පොත්පත් පවත්වාගෙන යාම

මල වගා උපදෙස් පොත්, මාර්ගෝපදේශ පත්‍රිකා සහ මල් හා වෙනත් පැල තොග වෙනුවෙන් ආරම්භක තොග ශේෂය, ගැණුම් හා විකුණුම් දැක්වෙන පරිදි විධිමත් තොග පාලන ගිණුම් ක්‍රමයක් අනුගමනය කර නොතිබුණි.

### 4.2 භාරකාර මණ්ඩල රැස්වීම්

උද්‍යාන භාර අරමුදල පිහිටුවීමේ ගිවිසුමේ 3(ඡ)(i) ජේදය ප්‍රකාරව අනුව භාරකාර මණ්ඩලය මාස 3 කට වරක්වත් රැස්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ එක් වරක් පමණක් රැස්වී තිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අරමුදලේ  ලේකම්වරයා වෙත වරින් වර යොමු කරන ලදී.  පහත සඳහන්  පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ) ගිණුම්කරණය

(ආ) ඉදිකිරීම්